සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය
சமூகவலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
Department of Divineguma Development

4වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4வதுமாடி,செத்சிரிபாய பத்தரமுல்ல
4th floor, Sethsiripaya ,Battaramulla

මගේ අංකය / எனது இல / My No: DDD/HO/07/ SD/02/සමෘ.කැකුළු

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2016.03.31

සියලුම දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල් /දිස්ත්‍රික් ලේකම් වරුන්,

සියලුම දිවිනැගුම දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන්,

සියලුම ප්‍රාදේශිය ලේකම්වරුන්,

<u>දිවිනැගුම/ සමෘද්ධි කැකුළු ළමා සමාජ සංස්කෘතික හා සාහිත්‍ය තරඟාවලිය 2016</u>

<u>හැඳින්වීම</u>

2004 වසරේ සිට 2015වසර දක්වා මෙම ජාතික තරඟාවලිය සිංහල හා දමිළ මාධ්‍යයෙන් වයස් කාණ්ඩ 03ක් ඔස්සේ සාර්ථකව පැවැත්වූ අතර ඒ සඳහා ඔබ හා ඔබගේ කාර්යය මණ්ඩලය දැක්වූ සහයෝගය ස්තුති පුර්වකව සිහිපත් කරමි.එමෙන්ම සමාජ සංවර්ධන වැඩසටහන තුළ ක්‍රියාත්මක කරනු ලබන සියළුම වැඩසටහන් වල මුඛ්‍ය පරමාර්ථය සමාජය වෙත ගෙන යාමට හැකියාව ඇති පාර්ශවකරුවන් ලෙස, ළමා සමාජ සමඟ බද්ධ වී ඇති දරුවන් හැඳින්විය හැකිය.

02 අඩු ආදායම්ලාභී පවුල් වල විවිධ කුසලතාවයන් ඇති දරුවන්ගේ ගේ සාහිත්‍යය හා කලා කුසලතාවයන් තවදුරටත් ඔප් නැංවීම සඳහා 2016 වසරේදි දිවිනැගුම/ සමෘද්ධි කැකුළු ළමා සමාජ සාහිත්‍යය හා සංස්කෘතික තරඟාවලිය බැංකු සංගම්, ප්‍රාදේශිය, දිස්ත්‍රික් මට්ටමින් හා ජාතික මට්ටමින් වයස් කාණ්ඩ 3 ක් ඔස්සේ ඉහත තරඟාවලිය පැවැත්වීමට තිරණය කර ඇත. දැනට ප්‍රතිසංවිධානය කර ඇති සහ අළුතින් ආරම්භ කල දිවිනැගුම/ සමෘද්ධි ළමා සමාජ දරුවන් සඳහා මේ වර්ෂයේ ද නව මුහුණුවරකින් දරුවන්ගේ අනාගතය සුරක්ෂිත කරමින් එකිනෙකාට ගරු කරන සංවේදි දරු පරපුරක් සඳහා මනස සකස් කිරීම අරමුණු කර ගනිමින් නිර්මාණශීලී දරු පරපුරක් ඇති කිරීම උදෙසා මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කෙරේ.

අධ්‍යක්ෂ ජනරාල්
பணிப்பாளர் நாயகம்
Director General
011-2883802/2872202
Fax-011-2889002
dg@divineguma.gov.lk

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
மேலதிகபணிப்பாளர்நாயகம்
Additional DirectorGeneral
011-2871672
Fax-011-2887280
adg@divineguma.gov.lk
anuradhakum@yahoo.com

අධ්‍යක්ෂ (පරිපාලන)
பணிப்பாளர் (நிர்வாகம்)
Director (Administration)
011-2873799
Fax-011-2873996
diradmin@divineguma.gov.lk

ප්‍රධාන ගණකාධිකාරී
பிரதான கணக்காளர்
Chief Accountant
011-2869742
011-2869742
finance@divineguma.gov.lk

කාර්යාලය
அலுவலகம்
Office
011-2872202
011-2887722 (Hotline)

03. මෙවරද විශේෂත්වය වන්නේ දිවිනැගුම සංවර්ධනවැඩසටහන, ග්‍රාමීය ප්‍රජාවගේ ජන ජීවිතය උසස්ව පවත්වා ගැනීමට ප්‍රමුඛතාවය ලබා දෙමින් අධ්‍යාත්මික සංවර්ධනය තුළින් ආර්ථික සංවර්ධනය ජය ගැනිමට**ප්‍රබල ප්‍රතිරෝධකයක්ව පවතින මත් හා දුම්වැටි භාවිතයට විරුද්ධ මතයක් ගොඩ නඟමින් මෙම මත් හා දුම්වැටි භාවිතය ජන ජීවිතයට කොතරම් බලපෑම්කරනවාද යන්න තේමාව කර ගනිමින්** බැංකු සංගම් හි, ප්‍රාදේශිය හා දිස්ත්‍රික් තරඟ පැවැත්වෙන ස්ථාන වල සන්නිවේදනය කළ යුතු පණිවිඩ රැගත් බැනර් ප්‍රදර්ශනයකළ යුතු වේ.මේ බැනර් සඳහා ආකෘති 4ක් ඇමුණුම අංක 01හි සඳහන් වේ.

ආකෘති හතරම මුද්‍රණය කර ප්‍රදර්ශනය කිරීම වඩාත් යෝග්‍ය වේ. එක් බැනරයක් අඩි 6 ක් දිග සහ පළල අඩි 3 ක් විය යුතුය. එක් බැනරයක් සඳහා උපරිමව වියදම් කළ හැක්කේ රු. 1,000/- කි. දිවිනැගුම/ සමෘද්ධි වැඩසටහනට නව ප්‍රචාරණයක් ලබා දීම සඳහා බැංකු සංගමයක් එක බැනරයක් ප්‍රදර්ශනය කළ යුතුයි.

පොදු තරඟ කොන්දේසි

i. මෙම තරඟාවලිය සිංහල හා දමිළයන භාෂා ද්විත්වයෙන්ම පැවැත්විය යුතු අතර ඒ ඒ මාධ්‍යවල දරුවන් නියමිත මාධ්‍යයන් පමණක් තරඟකළ යුතුයි. සිංහල මාධ්‍ය සඳහා තරඟ ඉසව් 12 ද දමිළ මාධ්‍ය සඳහා තරඟ අංශ 8 කින්ද තරඟාවලිය සමන්විත වේ.

ii. වයස් කාණ්ඩ පහත සඳහන් පරිදි වේ.

අවුරුදු 7 – 10 වයස් කාණ්ඩය	-	2010.01.01 – 2007.01.01
අවුරුදු 11 - 14 වයස් කාණ්ඩය	-	2006.12.31– 2003.01.01
අවුරුදු 15 – 18 වයස් කාණ්ඩය	-	2002.12.31– 1999 .01.01

ඉහත වයස් කාණ්ඩ සඳහා අදාල වර්ෂ අතරතුර උපන් දරුවන් නිසි ආකාරයෙන් පරික්ෂා කොට තරඟ අංශ සඳහා ඉදිරිපත් කිරීම ඔබගේ වගකීම වේ.

iii. කැකුළු ළමා සමාජ සමාජික සමාජිකාවන් පමණක් මෙම තරඟයට සහභාගි විය යුතු අතර **දිවිනැගුම/සමෘද්ධි බැංකුවේ ගිණුමක් නොමැති කිසිම දරුවකු තරඟ සඳහා ඉදිරිපත් නොකළ යුතුයි.** තරඟයේ මූලික අධියර බැංකු සංගම් මට්ටමින් ආරම්භ වීමත් සමඟම දිවිනැගුම/සමෘද්ධි බැංකුවල දරුවන් සඳහා ළමා ගිණුම්(කැකුළු/ සිසුරක) ආරම්භ වී තිබිය යුතු අතර නව ගිණුමක් නම් අවමය රු.500/- ක ශේෂයක් හා පැරණි ගිණුමක් නම්රු. 1,000/- ක අවම ශේෂයක්වත්තිබිය යුතුය. මෙහි මූලික අරමුණ වන්නේ දරුවන්ගේ ඉතිරි කිරීම් ප්‍රවර්ධනය කිරීම වේ.

iv. මීට පෙර වර්ෂ වලදි ජාතික මට්ටමේ තරඟයෙන් ප්‍රථම ස්ථානය හිමිකරගත් තරඟකරුවෙකු නැවත එම වයස් කාණ්ඩයෙන් තරඟ කිරීමට නොහැකිය.

v. තරඟ සඳහා දරුවන් යොමු කිරීමේ දී ව්‍යාජ හා වංචා සහගත නොවිය යුතු අතර එවැනි අක්‍රමිකතාවයන් ඇති වුවහොත් අදාල නිළධාරින් සඳහා විනයානුකූල පියවර ගැනීමට සිදුවන බව දන්වමි.

vi. තරඟ සඳහා ඉදිරිපත් වන දරුවන් තමන්ගේ අනන්‍යතාවය පිළිබිඹු වන සේ සුදුසු ඇදුමකින් සැරසි සිටිය යුතුයි. (ජන නැටුම් හැර) (උදා :- ගැහැණු දරුවන් ළමා සාරියකින්, පිරිමි දරුවන් ජාතික ඇදුම)

vii. දීප ව්‍යාප්තව පැවැත්වෙන දිවිනැගුම/සමෘද්ධි කැකුළු ළමා සමාජ තරඟාවලියේ අනන්‍යතාවය රැකෙන පරිදි හා සහතික සඳහා පොදු වටිනාකමක් ලබාදීමේ මූලික අරමුණින් එක් ආකෘතියකින් සහතිකයක් ලබා දිය යුතු යැයි තීරණය කර ඇත. ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමේ පවත්වන තරඟවලදි ජයග්‍රාහී දරුවන්සඳහා ලබා දීමට නියමිත සහතික ආකෘති දෙක සඳහා වන ග්‍රැෆික් සැලසුම් දෙක සහිත CD තැටිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දීමට කටයුතු කෙරේ.

viii. ජයග්‍රාහී දරුවන්ට සඳහා මූල්‍යමය ත්‍යාග ඔවුන්ගේ බැංකු ගිණුම් වලට (සිසුරක/ කැකුළු) බැර කිරීමට කටයුතු කෙරේ. ජාතික තරඟාවලිය අවසානයේදී අදාල දිස්ත්‍රික්ක වෙත පහත සඳහන් අයුරින් මුදල් නිදහස් කරනු ඇත. තවද දිස්ත්‍රික් මට්ටමින් ජයග්‍රහණය කරන දරුවන් සඳහා ත්‍යාග මුදල් ලබා දීමේදී පහත සීමාවන් නොඉක්මවිය යුතු බව වැඩිදුරටත් දන්වමි.

ස්ථානය	ඒකල	සමූහ
	ජාතික	ජාතික
ප්‍රථම	10,000/-	40,000/-
දෙවන	6,000/-	30,000/-
තෙවන	4,000/-	20,000/-
කුසලතා(දෙකකි)	(එකකට) 1,500/-	(එකකට) 10,000/-

<u>තරඟ විස්තර</u>

සියලු තරඟ විස්තර පහත වගුවේ ඇති පරිදි වන අතර චිත්‍ර, ළමා කතන්දර, කෙටි නාට්‍යය සඳහා පමණක් වැඩි විස්තර පහත පරිදි වේ.

I. චිත්‍ර තරඟය සඳහා 18 x 14 ප්‍රමාණයේ බ්‍රිස්ටල් බෝඩ් හෝ ඩ්‍රොවින් කඩදාසි භාවිතා කරන්න. එළිය, අඳුර සහ ත්‍රිමාන ලක්ෂණ පිළිබිඹු වන අයුරින් චිත්‍ර සංරචනයක යොදවන්න. ප්‍රකාශන චිත්‍ර පමණක් නිර්මාණය කළ යුතු අතර මෝස්තර චිත්‍ර ඇඳීම නොකළ යුතුය**. <u>ප්ලැටිනම් පෑන් භාවිතා නොකළ යුතුයි.</u>**

II. ළමා කතන්දර තරඟය සඳහා පැය 3 ක කාලයක් ලබා දී දරුවන්ට තම තේමාව මුලික කර ගත් නිර්මාණශීලී ළමා කතන්දරය ලිවීමට අවස්ථාවක් ලබා දී නිම කළ කෘතිය ලබා ගැනීමෙන් අනතුරුව එය බැංකු සංගම් මට්ටමේදී, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්මේදී හා දිස්ත්‍රික්, ජාතික මට්ටම් වලදි එම කතන්දර පොත ඉදිරිපත් කල යුතු වේ. එසේ සකසන ලද පොතේ පසු පිටෙහි ලකුණු දීම සඳහා අදාල ආකෘතිය භාවිතා කරන්න. (ඇමුණුම අංක - 02)ළමා කතන්දර කෘතිය නිර්මාණය කර භාර ගැනීමේදි එම පරික්ෂණ මණ්ඩලය, දරුවා විසින් තරඟයට සහභාගී වී නිර්මාණය කළ කෘතියක් බවට සහතික කළ යුතුය.

III. ළමා කතන්දර තරඟ ඉසව්ව සඳහා ජාතික මට්ටමේ දී දරුවන් ඉදිරිපත් නොකළ යුතු අතර ඔවුන් විසින් නිර්මාණය කරන ලද **"ළමා කතන්දර නිර්මාණය"** පමණක් අදාල දිනට හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතු වේ. එසේ අපොහොසත් වන තරඟකරුවන්ගේ ළමා කතන්දර ජාතික තරඟාවලියෙන් ප්‍රතික්ෂේප වනු ඇත. (දරුවෙක් තරඟය සඳහා ඉදිරිපත් කරන ළමා කතන්දර පොතේ තරඟකරුගේ නම,වයස් කාණ්ඩය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය,හා දිස්ත්‍රික්කය පැහැදිලිව සඳහන් කළ යුතු වේ.)

IV. කෙටි නාට්‍යය තරඟ ඉසව්ව සඳහාඅදාළ වන <u>**ආධ්‍යාත්මික සංවර්ධනය /සමාජීය වශයෙන් සමාජයට යහපත් පණිවිඩයක් ලබා දිය හැකි තේමාවක්**</u> තෝරා ගත යුතු වේ.

<u>සිංහල මාධ්‍ය තරඟ ඉසව්</u>

අනු අංකය	තරග ඉසව්	වයස් කාණ්ඩය	කාලය	වෙනත්
01	ගායනය ඒකල (සරල ගී)	7 – 10 11 -14 15 - 18	විනාඩි 3 - 5	මව්/ පිය ගුණ ගීතයක් ගැයිය යුතුය.
02	ගායනය ඒකල (ශ්‍රාස්ත්‍රිය)	7 – 10 11 -14 15 - 18	විනාඩි 3 – 5 විනාඩි 4 – 6 විනාඩි 5 – 7	රාගය - බිලාවල් රාගය - භූපාලි රාගය -මාලකෞන්ස්

03	වාදනය (ශ්‍රාස්ත්‍රිය/ ස්වරවාදය)	11 - 14 15 – 18	විනාඩි 4 – 6 විනාඩි 5 – 7	රාගය - කාෆි රාගය - භෛරවි තෝරා ගත් එක් වාද්‍ය භාණ්ඩයකින් පමණක් තරඟ කළ යුතුය. වයලින්, සිතාර්, බටනලා, එස්රාජ්
04	ජන ගායනය (ඒකල)	7 – 10 11 -14 15 - 18	විනාඩි 5 – 8	ආඝාතාත්මක හා අනාඝාතාත්මක වශයෙන් ඉදිරිපත් කළ යුතුයි. උදා. 01. සී පද 02. ශාන්ති කර්ම 03. නෙළුම් ඔසේ 04. රබන් ගී මෙයින් ඔබ කැමති ජන ගායනා ශෛලීන් තුනකට අයත් කවි ප්‍රාසාංගිකව ඉදිරිපත් කළ යුතුය.
05	ජන නැටුම් (සමූහ/ මිශ්‍ර) (සාම්ප්‍රදායික ජන නැටුම් ආශ්‍රයෙන්)	7 – 10 11 -14 15 - 18	විනාඩි 5 - 7	නර්ථනය - 12 අත්වැල් ගායනය - 04 (ළමා සමාජ දරුවන් විය යුතුයි. කණ්ඩායමේ උපරිම සංඛ්‍යාව 16 ක් විය යුතුය.)
06	උඩරට - ඒකල (මිශ්‍ර ගැ/පි)	11 -14 15 - 18	විනාඩි 3 - 5	සාම්ප්‍රදායික උඩරට නැටුම් සම්ප්‍රදායට අදාළ වන්නමක් විය යුතුයි.
07	පහතරට - ඒකල (මිශ්‍ර ගැ/පි)	11 -14 15 - 18	විනාඩි 3 - 5	සාම්ප්‍රදායික පහතරට නැටුම් සම්ප්‍රදායට අදාළ වන්නමක් විය යුතුයි.
08	කථික	7 – 10 11 -14 15 – 18	විනාඩි 5 - 7	වැඩසටහනට අදාල මාතෘකා දි.ලේ. කාර්යාලයෙන් සැපයිය යුතුයි.
09	නිවේදක (වැඩසටහනක් මෙහෙවීම)	7 – 10 11 -14 15 – 18	විනාඩි 5 - 7	කටහඬ/ වචන උච්චාරණය/ ඉදිරිපත් කිරීම කෙරේ අවධානය යොමු කිරීම.
10	චිත්‍ර	7 – 10 11 -14	පැය 03	පැස්ටල්/ දිය සායම් 18 x 14 බ්‍රසිල් බෝඩ් ඩ්‍රෝවින් කඩදාසි

		15 - 18		
11	ළමා කතන්දර (මාතෘකා විවෘතයි) ස්වාධීන නිර්මාණාත්මක කථා අංගයක් විය යුතුය. ඒ / 4 කොළ භාවිතා කරමින් පොත් පිංචක් ලෙස සකස් කළ යුතුය.	7 – 10 11 -14 15 - 18	පැය 03	වචන 100 – 150 වචන 250 – 300 වචන 400 – 500 ළමා කතන්දරයේ සම්පූර්ණ නම, වයස් කාණ්ඩය, දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, ළමා සමාජයේ නම සඳහන් කළ යුතුයි.
12	කෙටි නාට්‍යය (දිවිනැගුම වැඩසටහනට අදාළව) උදා. ප්‍රචාරණ මාධ්‍යයක් නොවන හුදු නාට්‍යමය ගුණය ඉස්මතු වන අයුරින් නිර්මාණය විය යුතුය.		විනාඩි 10 - 12	නාට්‍යය සඳහා සහභාගි වන සියළුම ශිල්පීන් ළමා සමාජ දරුවන් විය යුතුයි. උදා. රංගනය, නර්ථනය, හා ගායනය

<u>දමිළ මාධ්‍ය තරඟ ඉසව්</u>

අනු අංකය	තරඟ ඉසව්	වයස් කාණ්ඩය	කාලය	වෙනත්
01	ගායනය ඒකල (සරල ගී)	7 – 10 11 -14 15 - 18	විනාඩි 3 - 5	මව්/ පිය ගුණ ගීතයක් ගැයිය යුතුය.
02	ජන ගායනය (ඒකල)	7 – 10 11 -14 15 - 18	විනාඩි 4 – 6	ආඝාතාත්මක හා අනාඝාතාත්මක වශයෙන් ඉදිරිපත් කළ යුතුයි. (ධීවර ගීත, ගොයම් ගී, ඔංචිලි වාරම්)
03	ජන නැටුම් (සමූහ/ මිශ්‍ර) අම්මන් කුත්තු,	7 – 10 11 -14	විනාඩි 6 - 8	නර්ථනය - 12 අත්වැල් ගායනය - 04

	කුරහන්, කාවඩි, (කෝලාට්ටම් ශෛලීන් අශ්‍රයෙන් නිර්මාණය කළ යුතුය)	15 - 18		(ළමා සමාජ දරුවන් විය යුතුයි. කණ්ඩායමේ උපරිම සංඛ්‍යාව 16 ක් විය යුතු.)
04	නිවේදක	7 – 10 11 -14 15 - 18	විනාඩි 5 - 7	කටහඬ/ වචන උච්චාරණය/ ඉදිරිපත් කිරීම කෙරේ අවධානය යොමු කිරීම.
05	කථික	7 – 10 11 -14 15 - 18	විනාඩි 5 - 7	වැඩසටහනට අදාල මාතෘකා දි.ලේ. කාර්යාලයෙන් සැපයිය යුතුයි.
06	චිත්‍ර	7 – 10 11 -14 15 - 18	පැය 03	පැස්ටල්/ දිය සායම් 18 x 14 බ්‍රසිල් බෝඩ්, ඩ්‍රෝවින් කඩදාසි
07	ළමා කතන්දර (මාතෘකා විවෘතයි) ස්වාධින නිර්මාණාත්මක කථා අංගයක් විය යුතුය. ඒ/4 කොළ භාවිතා කරමින් පොත් පිංචක් ලෙස සකස් කළ යුතුය.	7 – 10 11 -14 15 - 18	පැය 03	වචන 100 – 150 වචන 250 – 300 වචන 400 – 500 ළමා කතන්දරයේ සම්පූර්ණ නම, වයස්කාණ්ඩය,දිස්ත්‍රික්කය,ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය, ළමා සමාජයේ නම සඳහන් කළ යුතුයි.
08	කෙටි නාට්‍යය (දිවිනැගුම වැඩසටහනට අදාළව) උදා. ප්‍රචාරණ මාධ්‍යයක් නොවන හුදු නාට්‍යමය ගුණය ඉස්මතු වන අයුරින් නිර්මාණය විය යුතුය.	විවෘත	විනාඩි 10 - 12	නාට්‍යය සඳහා සහභාගි වන සියළුම ශිල්පීන් ළමා සමාජ දරුවන් විය යුතුයි. උදා. රංඟනය, නර්ථනය, හා ගායනය

<u>කාල රාමුව, ක්‍රියාත්මක කිරීමේ වගකීම හා අනුමත කිරීම</u>

ඉහත දක්වා ඇති පරිදි සිංහල හා දමිළ මාධ්‍ය තරඟ බැංකු සංගම්, ප්‍රාදේශීය මට්ටමින් හා දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කළ යුතුයි.

අදියර	ක්‍රියාත්මක කිරීමේ වගකීම හා අනුමත කිරීම	කාලය
බැංකු සංගම් මට්ටම	වසමේ දිවිනැගුම සංවර්ධන නිළධාරි බැංකු සංගම් දිවිනැගුම කළමනාකරු	2016 ජූනි 15 ට පෙර
ප්‍රාදේශීය මට්ටම	සමාජ සංවර්ධන සහකාර, මුලස්ථාන කළමනාකරු/ කළමනාකාර අධ්‍යක්ෂ/ සහකාර ප්‍රාදේශීය ලේකම්/ ප්‍රාදේශීය ලේකම්	2016 ජූලි 30 ට පෙර
දිස්ත්‍රික් මට්ටම	සමාජ සංවර්ධන විෂය කළමනාකරු, දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ	2016 සැප්තැම්බර් 15 ට පෙර
ජාතික මට්ටම	අධ්‍යක්ෂ (සමාජ සංවර්ධන), අංශයේ සියලුම නිළධාරීන්	2016 ඔක්තෝබර් 30 ට පෙර
ජාතික ජයග්‍රහණ ඇගයීම	අධ්‍යක්ෂ (සමාජ සංවර්ධන), අංශයේ සියලුම නිළධාරීන්	2016 නොවැම්බර් / දෙසැම්බර්

i. දිස්ත්‍රික් මට්ටම දක්වා තරඟ පැවැත්වීමෙන් අනතුරුව ඒ ඒ තරඟ ඉසව්වකින් අදාළ වයස් කාණ්ඩවලින් ප්‍රථම ස්ථානය දිනා ගත් දරුවන් ජාතික තරඟය සඳහා ඉදිරිපත් කළයුතු වේ.

ii. ඉහත කාල පරිච්ඡේදයට අනුව තරඟාවලියේ අදාළ මට්ටම් නිම කළ යුතු අතර දිස්ත්‍රික් තරඟයේ තරඟ ප්‍රතිඵල සැප්තැම්බර් මස 05 වන දිනට ප්‍රථම දී ඇති ආකෘතියට අනුව පැහැදිලිව සකස් කර ප්‍රධාන කාර්යාලයේ සමාජ සංවර්ධන අංශය වෙත එවිය යුතු වේ.

iii. ජාතික තරඟය සඳහා නාමලේඛන ඉදිරිපත් කිරීමේදී තරඟකරුවන්ගේ නම් නිවැරදිව සටහන් කර එවීමට විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය. දරුවන්ගේ නම්වල මුලකුරු ඉංග්‍රීසි අක්ෂරවලින් සටහන් කළ යුතුය. දමිළ මාධ්‍යය දරුවන්ගේ සම්පූර්ණ නම් ඉංග්‍රීසි මාධ්‍යයෙන් හා දමිළ මාධ්‍යයෙන් එවීමට කටයුතු කරන මෙන් ඉල්ලමි. **<u>(පහත ආකෘතිය භාවිතා කරමින් පමණක් අදාල තරඟ ප්‍රතිඵල එවීමට කටයුතු කරන මෙන් අවධාරණය කරමි.)</u>**

උදාහරණ :-

අනු අංකය	දිස්ත්‍රික්කය	ප්‍රා.ලේ.කො	තරහ ඉසව්ව	වයස් කාණ්ඩය	තරහකරුගේ නම	ලබා ගත් ස්ථානය
ඒකල තරහ සඳහා						
01	ගම්පහ	මහර	කථික	7 - 11	A.D. ඉෂිනි භාශිකා කොතලාවල	ප්‍රථම
02	මාතර	මාතර	ජන නැටුම් (සමූහ මිශ්‍ර)	15 -18	A.D. නයනා අනුත්තරා පෙරේරා	ප්‍රථම
					අත්වැල් ගායනා සඳහා නම්ද සමග මේ අයුරින් 1 – 16 දක්වා නිවැරදිව සටහන් කරන්න	

<u>විනිශ්චය මණ්ඩලය තෝරා ගැනීම හා අනුමත කිරීම</u>

බැංකු සංගම්, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටම්වලදි තරහ අංශ විනිශ්චය කිරීම සඳහා ඒ ඒ විෂයන් සඳහා නිපුණතාවයකින් යුතු නිළධාරින් පත් කර ගත යුතු අතර එසේ පත් කර ගන්නා විනිශ්චය මණ්ඩලය ප්‍රාදේශීය ලේකම් හා දිස්ත්‍රික් ලේකම් විසින් අනුමත කළයුතු වේ.

<u>ප්‍රතිපාදන</u>

බැංකු සංගම් මට්ටමේ දී උපරිමය රු. 10,000/- ක් ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ දී තරහ සඳහා රු. 15,000/- ක උපරිමයකට යටත්වසමාජ සංවර්ධන පදනමින් වියදම් දැරීමට අනුමැතිය ලබාදෙමි. දිස්ත්‍රික් තරහ සඳහා වියදම් ඇස්තමේන්තුව ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ප්‍රතිපාදන නිදහස් කිරීමට කටයුතු කෙරේ. මෙම වැඩසටහන සාර්ථක කරගැනීමට ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

චන්ද්‍රා වික්‍රම්සිංහ

අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-

01. ලේකම්, සමාජ සවිබල ගැන්වීමේ හා සුභසාධන අමාත්‍යාංශය - කාරුණික දැ.ගැ.ස
02. ප්‍රධාන ගණකාධිකාරී, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - කරු.අ.ක.ස
03. ප්‍රධාන අභ්‍යන්තර විගණක, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - එම
04. සියලුම අධ්‍යක්ෂවරුන්, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - එම
05. සියලුම බැංකු කලාප භාර දිවිනැගුම කළමණාකරුවන් - එම